# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩත්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, Fax: +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org

## ඌව පළාත් සභා මැතිවරණය 2014 - මාධ්‍ය නිවේදනය අංක 02

**2014 සැප් 20. කොළඹ ශ්‍රී ලංකාව :** ඌව පළාත් සභා මැතිවරණයේ ඡන්දය ප.ව.4.00ට අවසන් විය. ඡන්දය පැවති කාලසීමාව තුළ ඇති වූ සිදුවීම්වල වැඩිදුර විස්තරයක් පහත දැක්වේ.

**2014 සැප් 20: ඌව පළාත බදුල්ල දිස්ත්‍රික්කය,බණ්ඩාරවෙල ඡන්ද කොට්ඨාශය:** එ.ජා.ප පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා මහතා ප්‍රකාශ කල පරිදි එ.ජා.ප ආධාරකරුවන් පිරිසක් දියතලාවේ සිට බණ්ඩාරවෙල දක්වා ගමන් කරමින් සිටියහ. එවිට වෑන් රථයකින් බැස පැමිණි පිරිසක් විසින් ඔවුන්ගේ මාර්ගය අවහිර කරනු ලැබිණ. එ.ජා.ප අපේක්ෂක හරීන් ප්‍රනාන්දු මහතාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා වන ප්‍රේමසිරි මහතාට දකුණු පළාත් සභා මන්ත්‍රී ඩී.වී උපුල් මහතා විසින් කඩුවක නොකැපෙන පැත්තෙන් පහර දෙනු ලැබිණි. ප්‍රහාරකයන් විසින් වෙඩි පහර කිහිපයක් අහසට එල්ලකරනු ලැබූ බවද ඇසින් දුටු සාක්‍ෂිකරුවන් පවසා ඇත.

**2014.සැප් 20: ඌව පළාත, මොණරාගල දිස්ත්‍රික්කය, වැල්ලවාය, ඇතිලිවැව මහ විදුහල:** මැ.ප්‍ර.නි.ම.ය වෙත පැමිණිල්ලක් යොමු කළ මොණරාගල එ.ජ.නි.ස මැතිවරණ ක්‍රියාන්විතය ප්‍රකාශ කළේ මනාප අංක 17 යටතේ තරඟ කරන එ.ජා.ප අපේක්‍ෂක රෝයි කාලිංග තම ආධාරකරුවන් 25 දෙනෙකු සමඟ ඡන්දය ප්‍රකාශ නොකරන ලෙස එ.ජ.නි.ස අපේක්‍ෂකයකු හට තර්ජනය කරන ලද බවය. පොලීසිය විසින් පැමිණිල්ල විභාග කිරීම ප්‍රතික්‍ෂේප කල බවටද එ.ජ.නි.ස විසින් චෝදනා කර සිටි අතර පෙ.ව 9.15 ට පැමිණිලි අංක 48 ලෙස එම පැමිණිල්ල භාර ගනු ලැබූ බවය.

**2014 සැප් 20: ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, හාලිඇල, ශාන්ත ජේම්ස් දෙමළ විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය:** මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් විසින් වාර්තා කළ පරිදි ඡන්දදායකයකු වන පද්මනාදන් යෝගරත්නම් මහතා ට පිහියකින් පහර දෙනු ලැබ ඇත. මෙය සිදුවී ඇත්තේ ඔහු තම ඡන්දය පාවිච්චි කිරීමට පැමිණෙන විටදී ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 200 ක් පමණ නුදුරේදීය. පහර කෑ අයගේ සොහොයුරා විසින් හඳුනාගෙන ඇති පරිදි පහරදී ඇත්තේ ජ.විපෙ ආධාරකරුවකු වන ෂන්මුගනාදන් නැමැත්තා විසින් වන අතර ඔහු පෙර දින

පහර කෑ අය සමඟ ආරවුලක් ඇතිකර ගෙන ඇත. තුවාලලත් තැනැත්තා බදුල්ල මූලික රෝහලට ඇතුලත් කරනු ලැබිණි. ඒ.ජ.නි.ස විසින් විමසා සිටි කල රෝහල් ප්‍රකාශකයකු මැ.ප්‍ර.නි.ම වෙත පැවසුවේ පද්මනාදන් යෝගරත්නම් නැමැත්තෙකු වාට්ටු අංක 8 ට ඇතුලත් කරණු ලැබූ බවය. කෙසේ නමුත් වැඩිදුර විස්තර කිසිවක් ප්‍රකාශ කිරීම රෝහල විසින් ප්‍රතික්ෂේප කරන ලදි. වැඩි විස්තර දැන ගැනීම පිණිස රෝහල් අධිකාරිවරයා සම්බන්ධකර ගැනීමට මැ.ප්‍ර.නි.ම.ය කල උත්සාහය අසාර්ථක විය. බදුල්ල මූලික රෝහලේ පොලීසිය ප්‍රකාශ කොට සිටියේ මෙම සිද්ධිය මැතිවරණ ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ නොවූ පෞද්ගලික ආරවුලක් බවයි.තුවාල වූ පුද්ගලයාගේ සොහොයුරා විසින් මැ.ප්‍ර.නි.ම.යට ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ මෙය මැතිවරණයට සම්බන්ධ සිදුවීමක් බවය.

**2014 සැප් 20: ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, බිබිල ඡන්ද කොට්ඨශය වෙල්ලස්ස ජාතික පාසල:** මෙම පාසල ඉදිරිපිට දී එ.ජා.ප. කාර්යාලයක් පවත්වා ගෙන ගිය එච්.ඒ දුෂ්‍යාන්තට අයත් වූ හෝටලයකට වාහන 5 කින් පැමිණි 30 ක් පමණ වූ පිරිසක් විසින් පහර දෙනු ලැබිණි. මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් එම ස්ථානයට ගිය විට සිද්ධිය ඇසින් දුටුවන් ප්‍රකාශ කොට සිටියේ නාඳුනන කණ්ඩායමක් හෝටලයට කඩා වැදී ඉහත සඳහන් පුද්ගලයා ඇතුළු 3 දෙනෙකු හට පහරදී පොලීසිය පැමිණෙන විට ඔවුන් එම ස්ථානයෙන් පලා ගිය බවයි.

**2014 සැප් 20: ඌව පළාත මොණරාගල දිස්ත්‍රික්කය, බිබිල මොණරාගල මාරිඅරාව මහ විදුහල ඡන්ද මධ්‍යස්ථානය:** මැ.ප්‍ර.නි.ම. ය වෙත පැමිණිල්ලක් යොමුකරන ඒ.ජ.නි.ස මොණරාගල දිස්ත්‍රික් මෙහෙයුම් කාර්යාලය පැමිණිලි කොට සිටියේ ඒ.ජ.නි.ස නියෝජිතයන් දෙදෙනකු හට මාරිඅරාව ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවීමට ඉඩ නොදෙන ලද බවය.

**2014 සැප් 20: ඌව පළාත බදුල්ල දිස්ත්‍රික්කය, හපුතලේ පිටරත්මලේ බණ්ඩාරවෙල කණිෂ්ඨ දෙමළ විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය:** මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයකු විසින් වාර්තාකර සිටියේ ඒ.ජ.නි.ස ඡන්ද සලකුණ සහ අලගන් සෙන්දිල් තොණ්ඩමන් මහතාගේ ඡන්ද මනාප අංකය අංක 2 සඳහන් කල, UPVK 3519 දරණ ත්‍රීවිලර් රථයක් ඡන්ද මධ්‍යස්ථානයේ සිට මීටර් 50 ක පමණ දුරින් සැලකිය යුතු කාලයක් තුළ නවතා තිබූ බවය. මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයා ත්‍රිවීල් රියදුරාගෙන් විමසා සිටි විට ඔහු හෙළිදරව් කොට සිටියේ සෙන්දිල් තොණ්ඩමන් මහතාගේ ආධාරකරුවන් විසින් ඡන්ද දිනය දක්වා වන කාලය තුළ ස්ටිකරය ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් දිනකට තමාට රුපියල් 1000/- ක පමණ මුදලක් ලබා දීමට ඉදිරිපත් වූ බවය. ත්‍රිවීලර් රියදුරා වැඩිදුරටත් කියා සිටියේ අනෙකුත් බොහෝ වාහනවලටද එබඳු ගෙවීම් කිරීමට ඉදිරිපත් වීම් සිදුවූ බවය.

**2014 සැප් 20: ඌව පළාත මොණරාගල දිස්ත්‍රික්කය, වැල්ලවාය ඔක්කම්පිටිය මහා විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය:** මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් විසින් වාර්තා කොට සිටියේ බුලත් කොළය ඡන්ද ලකුණ සහ මනාප අංක 15 සඳහන් වූ මැතිවරණ ව්‍යාපාරයේ මුද්‍රිත ලිපි ලේඛණ අංක 34-35 යන ඡන්ද මධ්‍යස්ථාන අවට ( ඔක්කම්පිටිය ජනපද කණිටු විදුහල- ශාලා අංක 1 සහ 2) තිබූ බවය. මනාප අංක 15 ඡන්ද අපේක්ෂක ශෂින්ද්‍ර රාජපක්ෂ මහතාගේ අංකයයි. (මේ පිළිබඳ ඡායාරූප සාක්ෂි පවති. එමෙන්ම පිළිවෙලින් ඒ.ජ.නි.ස ඡන්ද සලකුණ)

**2014 සැප් 20,ඌව පළාත,මොණරාගල දිස්ත්‍රික්කය,වැල්ලවාය,ඔක්කම්පිටිය මහ විද්‍යාලීය ඡන්ද මධ්‍යස්ථානය.** මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් විසින් වාර්තා කොට සිටියේ නිල්පාට පසුබිමක කහපාටින් අංක 9 සඳහන් කල ස්ටිකර් අලවා තිබූ වාහනයක් ඡන්ද මධ්‍යස්ථානය පිටත නවතා තිබුණු බවය. එම වාහනයේ ලියාපදිංචි අංකය වූයේ WPKH 3434 ය. ( ඡායාරූපමය සාක්ෂි ඇත.)

**2014 සැප් 20: ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය හාලිඇල දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය රොක්හිල් ඡන්ද මධ්‍යස්ථානය:** මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් වාර්තාකොට සිටියේ එ.ජ.නි.ස පක්‍ෂ සලකුණ සහිතව මානෙල් රත්නායක (මනාප අංක 17) ආර්.එම්.නිමල් (මනාප 9) සහ ඩී.සී.දොන් සම්පත් (මනාප අංක 07) සඳහන් වූ ප්‍රචාරක පත්‍රිකා ඡන්ද මධ්‍යස්ථානයට නුදුරු ස්ථානවල තිබී හමු වු බවය.

**2014 සැප් 20: ඌව පළාත ,බදුල්ල දිස්ත්‍රික්කය හාලි ඇල වේවැල්හින්න ඡන්ද මධ්‍යස්ථානය:** මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්‍ෂකයන් විසින් වාර්තා කොට සිටියේ තරුණයන් 5 දෙනෙකුගෙන් සමන්විත වූ කණ්ඩායමක් ඡන්ද මධ්‍යස්ථානයෙන් මීටර් 100 ක් පමණ දුරකදී ඡන්දදායකයන් හට කතාකරමින් සිටි බවය. ඔවුන් මනාප අංක 3 යටතේ තරඟ කරන එ.ජ.නි.ස අපේක්ෂක අජිත් දේශප්‍රිය මහතාට ඡන්දය දෙන ලෙස ඡන්දදායකයන්ගෙන් ඉල්ලා සිට ඇත.

**2014 සැප් 20: ඌව පළාත මොණරාගල දිස්ත්‍රික්කය,බිබිලේ, බිබිල නාගල මොණරාගල නාගල පියරතන කණිටු විදුහල:** මැ.ප්‍ර.නි.ම වෙත පැමිණිල්ලක් යොමු කල මොණරාගල දිස්ත්‍රික් එ.ජ.නි.ස පක්‍ෂ කාර්යාලය කියා සිටියේ ආබාධිත පුද්ගලයන් හට ඡන්දය පාවිච්චි කිරිමට ඉඩ දෙනු නොලබනු ඇති බවට ප්‍රධාන ඡන්ද පොල නිලධාරියා කියා සිටි බවය. මේ පිළිබඳව එ.ජ.නි.ස පක්ෂ කාර්යාලය විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙතද පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇති බව වාර්තාවේ.

**2014 සැප් 20: ඌව පළාත මොණරාගල දිස්ත්‍රික්කය වැල්ලවාය, කිරිඉබ්බන්වැව බණ්ඩාරනායක ද්වීතික පාසල:** මැ.ප්‍ර.නි.ම වෙත පැමිණිල්ලක් යොමු කල එ.ජ.නි.ස. මොණරාගල පක්ෂ කාර්යාලය කියා සිටියේ කිරිඉබ්බන්වැව බණ්ඩාරනායක ද්විතියික පාසල් ඡන්ද මධ්‍යස්ථානය වෙත සුදු පැහැති වෑන් රථයක් මගින් ඡන්දදායකයන් ප්‍රවාහනය කරමින් සිටි බවය. මෙය සිදු වූයේ කිරිඉබ්බන්ආර චාමර පාලමට ආසන්නවය. බස්රථයේ සිටි පුද්ගලයන් රතු පැහැති කොඩි වනමින් සිටි බවද ඔවුන් වැඩි දුරටත් කියා සිටියි.

**2914 සැප් 20: ඌව පළාත් මොණරාගල දිස්ත්‍රික්කය,බිබිල,මැදගම,මොණරාගල බිබිල මුල්ල කනිටු විද්‍යාලය:** මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් හට පැමිණිල්ලක් යොමුකළ එ.ජ.නි.ස මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ මෙහෙයුම් කාර්යාලය වාර්තාකොට සිටියේ ජ්‍යේෂ්ඨ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරියා විසින් ආබාධිත පුද්ගලයන් හට තම ඡන්දය පාවිච්චි කිරීමට අවශ්‍ය විධිවිධානයන් නිසිලෙස නොයෙදු බවය.

**2014 සැප් 20: ඌව පළාත, මොණරාගල දිස්ත්‍රික්කය, සියඹලාණ්ඩුව, කුඹුක්ගේයාය, එක්සත් පරෝපකාර සමිති ශාලාව:** ඇතිමලේ වැව ඡන්ද මධ්‍යස්ථානය එ.ජ.නි.ස පක්‍ෂ කාර්යාලය විසින් මැ.ප්‍ර.නි.මය වෙත පැමිණිල්ලක් යොමු කරමින් කියා සිටියේ මැතිවරණ රාජකාරිවල යොදවා සිටි කරුණාමුණි නම් වූ පොලිස් නිලධාරියා (63245) ඡන්දදායකයන්ට තම ඡන්දය පාවිච්චි නොකරන ලෙස කියමින් බිය වැද්දු බවය..

1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සන්ධානය එක් වී මැ.ප්‍ර.නි.ම.ය ස්ථාපිත කරනු ලැබුයේ ස්වාධීන සහ පක්ෂවාදි නොවන සංවිධානයක් ලෙස මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම් නිරීක්ෂණය කිරීම සඳහාය. වර්තමානයේ මැ.ප්‍ර.නිම.ය ස්වාධීන වනුයේ වි.ප්‍ර.කේ. (CPA) නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) ඉන්ෆෝම් මානව හිමිකම් ප්‍රලේඛණ මධ්‍යස්ථානය (INFORM) යන සංවිධානයන්ගෙනි.